### *I වන උපලේඛනය*

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කරන ලද ව්‍යාපාරයේ විස්තර**

| | | |
|---|---|---|
| 1. අයදුම්කරුගේ නම | එම්.එම්.බී.එල්. ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් (MMBL INTERNATIONAL PRIVATE LIMITED) | |
| 2. බලයලත් තැනැත්තාගේ බලපත්‍ර අංකය | 2501280113 | |
| 3. බලපත්‍රය නිකුත් කළ දිනය | 2025 අප්‍රේල් 8 | |
| 4. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2025 සැප්තැම්බර් 20 දිනැති අංක 2454/62 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද, 2025 අංක 1 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගය | |
| 5. ව්‍යාපාරික ක්ෂේත්‍රය | උපදේශන සේවාව | |
| 6. අපේක්ෂිත විදේශ ආයෝජන ලැබීම් (එ.ජ. ඩොලර්) | වර්ෂය 1 | 50,000 |
| | වර්ෂය 2 | - |
| | වර්ෂය 3 | 25,000 |
| | වර්ෂය 4 | - |
| | වර්ෂය 5 | - |
| 7. අපේක්ෂිත රැකියා අවස්ථා (සංඛ්‍යාව) | වර්ෂය 1 | 5 |
| | වර්ෂය 2 | 6 |
| | වර්ෂය 3 | 6 |
| | වර්ෂය 4 | 7 |
| | වර්ෂය 5 | 7 |
| 8. වාණිජ කටයුතු ආරම්භ කිරීම (දිනය) | මෙම ගැසට් නියෝගය ප්‍රකාශයට පත්කළ දිනයෙන් මාස 03කින් | |

### *II වන උපලේඛනය*

**ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සැලකිල්ලට ගනු ලැබ ඇත.

හොංකොං හි සංස්ථාපිත සමාගමක් වන MMBL ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් (MMBL International), මර්කන්ටයිල් මර්චන්ට් බැංකු ලිමිටඩ් (Mercantile Merchant Bank Limited) හි පාලිත සමාගමකි. මර්කන්ටයිල් මර්චන්ට් බැංකු ලිමිටඩ් හි ඉතිහාසය, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රථම ශ්‍රී ලාංකික අධිපතිවරයා, සෙනෙට් සභිකයෙකු, මූල්‍යකරුවෙකු සහ පරිත්‍යාගශීලියෙකු වූ දේශමාන්‍ය එන්. යූ. ජයවර්ධන මහතා විසින් පිහිටුවන ලද ව්‍යාපාරික සමූහය දක්වා දිව යයි. MMBL ඉන්ටර්නැෂනල් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම, පුළුල් ව්‍යාපාරික සහායක සේවාවන් සපයන ව්‍යාපාරික ක්‍රියාවලි බාහිරකරණ (BPO) ආයතනයක් ලෙස කටයුතු කරනු ඇත.

සමාගම කොළඹ වරාය නගරය තුළ සිය මෙහෙයුම් හරහා ලේකම් කටයුතු, නීති සේවා, මානව සම්පත් (HR) සේවා සහ ගණකාධිකාරී සේවා සපයනු ඇත. මෙම ව්‍යාපාරය ඉලක්ක කර ගන්නා වෙළඳපොළ, යුරෝපය, මැද පෙරදිග සහ ඈත පෙරදිග කලාපයන් පුරා විහිදුණු විවිධ ප්‍රමාණයේ සමාගම්, පුද්ගලයන් සහ ලාභ නොලබන සංවිධාන ලෙස වර්ගීකරණය කර ඇත.

